# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## 9

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 10 ශ්‍රේණිය

## බැංකු ගිණුම හා බැංකු සැසඳුම් විස්තරය

1. ව්‍යාපාරයක අයිතිකරුවකු විසින් තමන් සතු මුදලක් බැංකු ජංගම ගිණුමක තැන්පත් කරනු ලබයි. මෙහි ද්විත්ව සටහන් ස්වරූපය හඳුනාගනු ලබන්නේ,

    1) බැංකු ගිණුම හර මුදල් ගිණුම බැර
    2) බැංකු ගිණුම හර බැංකු ගිණුම බැර
    3) මුදල් ගිණුම හර බැංකු ගිණුම බැර
    4) මුදල් ගිණුම හර මුදල් ගිණුම බැර

2. ව්‍යාපාරිකයෙක් වන හසාරා විද්‍යානී තමන් සතු රු. 50,000ක මුදලක් වැල්ලව ලංකා බැංකු ශාඛාවේ තැන්පත් කර ඇත. මෙහිදී මුදල් තැන්පත් කළ බවට ලැබෙන සාක්ෂි ලියවිල්ල කුමක්ද?

    1) මුදල් තැන්පතු බැරපත
    2) මුදල් තැන්පතු හරපත
    3) මුදල් ආපසු ලබා ගැනීමේ චවුචරය
    4) මුදල් තැන්පත් කුවිතාන්සිය

3. අත්පිට විකුණුම් මගින් ලද රු.30,000කි. මෙම මුදල බැංකුවේ එම අවස්ථාවේදීම තැන්පත් කරනු ලැබුවේ නම් අදාල ද්විත්ව සටහන වන්නේ,

    1) බැංකු ගිණුම හර මුදල් ගිණුම බැර
    2) බැංකු ගිණුම හර විකුණුම් ගිණුම බැර
    3) මුදල් ගිණුම හර විකුණුම් ගිණුම බැර
    4) විකුණුම් ගිණුම හර බැංකු ගිණුම බැර

4. ණය හිමියෙකුට චෙක්පතක් නිකුත් කළ පසු චෙක්පතෙහි ඉතිරිවන කුඩා කොටස ඔබ හඳුනාගන්නේ කුමක් ලෙසද?

    1) චෙක් බැරපත
    2) චෙක් හරපත
    3) චෙක් පිලිපත
    4) චෙක් තැන්පතු පත්‍රිකාව

5. චෙක්පතක් මගින් කිසියම් ගෙවීමක් සිදුකර තිබේ නම් එය වාර්තා කිරීමට යොදා ගන්නා ද්විත්ව සටහන වන්නේ,

    1) මුදල් ගිණුම හර වියදම් ගිණුම බැර
    2) වියදම් ගිණුම හර චෙක් පත් ගිණුම බැර
    3) වියදම් ගිණුම හර බැංකු ගිණුම බැර
    4) බැංකු ගිණුම හර වියදම් ගිණුම බැර

6. චෙක්පතක් අගරු වන්නේ,

1) බැංකුව විසින් චෙක්පත ප්‍රතික්ෂේප කිරීම නිසාය
2) බැංකුව විසින් චෙක්පත පිළිගැනීම නිසාය
3) බැංකුව විසින් ගනුදෙනුකරුට මුදල් ගෙවීම නිසාය
4) බැංකුව විසින් ගිණුම් හිමියාට ණය ලබා දීම නිසාය

7. චෙක්පතක් අගරුවීමට හේතුවකි

1) ජංගම ගිණුම අළුතින් ආරම්භ කර තිබීම
2) චෙක්පත තීන්ත පෑනකින් ලියා තිබීම
3) චෙක්පත බැංකු කවුන්ටරය වෙත ඉදිරිපත් නොකිරීම
4) ජංගම ගිණුමේ මුදල් නොමැති වීම

8. තැන්පත් කරන ලද චෙක්පතක් පසුව අගරු වී ඇති බව බැංකුවෙන් දැනුම් දී ඇත. එය ගිණුම්ගත කිරීමේ ජර්නල් සටහන ලෙස ඔබ යොදා ගන්නේ කුමක්ද?

1) මුදල් ගිණුම හර  බැංකු ගිණුම බැර
2) අදාල ගිණුම හර  බැංකු ගිණුම බැර
3) අදාල ගිණුම හර  මුදල් ගිණුම බැර
4) බැංකු ගිණුම හර  අදාල ගිණුම බැර

9. දුවිදු චමෝද්ගේ ව්‍යාපාරයට ණයගැතියෙකුගෙන් ලැබුණු රු.15,000ක චෙක්පත හිරිපිටිය මහජන බැංකුවේ තැන්පත් කරන ලදී. නමුත් එම චෙක්පත අගරුවී ඇත. මෙම අගරු වීම වාර්තා කළ යුත්තේ කෙසේද?

1) බැංකු ගිණුම හර  මුදල් ගිණුම බැර
2) බැංකු ගිණුම හර  ණයගැතියාගේ ගිණුම බැර
3) ණයගැතියාගේ  ගිණුම හර බැංකු ගිණුම බැර
4) ණයගැතියාගේ  ගිණුම හර මුදල් ගිණුම බැර

10. සැපයුම්කරුවකුට චෙක්පතක් නිකුත් කළ ද කිසියම් දෝෂයක් හේතුවෙන් පසුව එම චෙක්පත අගරු වී ඇත. එම අගරු වීම ඔබ වාර්තා කරනුයේ කෙසේද?

1) බැංකු ගිණුම හර  අදාල ගිණුම බැර
2) බැංකු ගිණුම හර  මුදල් ගිණුම බැර
3) අදාල ගිණුම හර  බැංකු ගිණුම බැර
4) බැංකු ගිණුම හර  චෙක්පත් ගිණුම බැර

11. රු.25,000ක ණයහිමියෙකු වූ චලකට නිකුත් කරන ලද චෙක්පත අගරුවී ඇති බව දැනුම් දී තිබේ. මෙම අගරුවීම වාර්තා කරනුයේ කෙසේද?

1) ණය හිමි ගිණුම හර  බැංකු ගිණුම බැර
2) බැංකු ගිණුම හර  ණයහිමි ගිණුම බැර
3) වියදම් ගිණුම හර  බැංකු ගිණුම බැර
4) මුදල් ගිණුම හර  බැංකු ගිණුම බැර

12. බැංකු අයිරාව ඔබ හඳුනාගන්නේ කුමන පහසුකමක් ලෙස ද?

1) හැකි තරම් මුදල් බැංකු ගිණුමේ තැන්පත් කිරීමට ලැබෙන පහසුකමකි
2) බැංකු ජංගම ගිණුමේ පවතින ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කිරීමේ පහසුකමකි
3) බැංකුවෙන් අතිරේක ණය ලබා ගැනීමේ පහසුකමකි
4) බැංකු ගිණුමේ ශේෂය අවසන්වන තුරු චෙක්පත් නිකුත් කිරීමේ පහසුකමකි

13. බැංකු ප්‍රකාශනය (Bank Statement) යනු,

1) ව්‍යාපාරය විසින් මාසිකව පිළියෙල කරනු ලබන ලේඛනයකි
2) ව්‍යාපාරයේ මුදල් භාරකරු විසින් පිළියෙල කරනු ලබන ලේඛනයයි
3) බැංකුව විසින් මසකට වරක් ජංගම ගිණුම් හිමියා වෙත එවනු ලබන ප්‍රකාශයයි
4) ආදායම් දෙපාර්තමේන්තුව වෙත ව්‍යාපාරය ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශයයි

14. ව්‍යාපාරයේ ණය හිමියන් වෙත ගනුදෙනු පියවීම සඳහා ලබා දුන් නමුත් තවම බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් අප හඳුනාගනු ලබන්නේ,

1) ස්ථාවර නියෝග මත ගෙවීම් ලෙස
2) සෘජු ප්‍රේෂණ ලෙස
3) තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් ලෙස
4) නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් ලෙස

15. ව්‍යාපාරයේ ගනුදෙනුකරුවන්ගෙන් ලැබී බැංකුවට යොමු කර ඇතත් තවම ව්‍යාපාරයේ ජංගම ගිණුමේ නොදැක්වෙන චෙක්පත් අප හඳුනා ගනුයේ,

1) ස්ථාවර නියෝග මත කළ ගෙවීම් ලෙසය
2) තැන්පත් කළ නිෂ්කාශනය නොවූ චෙක්පත් ලෙසය
3) නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් ලෙසය
4) බැංකු ගාස්තු සහ චෙක්පත් ගාස්තු ලෙසය

16. සෘජු ප්‍රේෂණයන් යනු කුමක්ද?

1) චෙක්පත් අගරුවීමයි.
2) ව්‍යාපාරයේ විවිධ වියදම් බැංකුව විසින් ගෙවීමයි
3) ණය හිමියන් සඳහා ගෙවිය යුතු මුදල් බැංකුවෙන් ගෙවීමයි
4) ණය ගැතියන් විසින් ගෙවිය යුතු මුදල් සෘජුවම ව්‍යාපාරයේ ජංගම ගිණුමේ තැන්පත් කිරීමයි

17. ස්ථාවර නියෝග මත බැංකුව කළ ගෙවීම් ව්‍යාපාරය විසින් සටහන් කරනුයේ,

1) මුදල් ගිණුමේ හරට ය
2) බැංකුවේ ගිණුමේ බැරට ය
3) මුදල් ගිණුමේ බැරට ය
4) බැංකු ගිණුමේ හරට ය

18. බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීමේදී භාවිතා කරනු ලබනුයේ,

1) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් පමණි
2) නිකුත් කළ ඉදිරිපත් නොවූ චෙක්පත් පමණි
3) උපලබ්ධි නොවූ හා නිකුත් කළ ඉදිරිපත් නොවූ චෙක් පත් පමණි
4) ස්ථාවර නියෝග මත කළ ගෙවීම් පමණි

19. චෙක්පත් නිකුත් කිරීමකදී භාවිතා කරන මූලාශ්‍ර ලේඛනයක් වන්නේ,

1) චෙක් තැන්පතු පත්‍රිකාව
2) ගෙවීම් වවුචරය
3) බැංකු ප්‍රකාශ
4) මුදල් තැන්පතු පත්‍රිකාව

20. 2021 ජුනි මාසයේ චනුකගේ ව්‍යාපාරයට ලද බැංකු ප්‍රකාශනයේ තිබූ බැර ශේෂය රු.18,000කි. එදිනට ව්‍යාපාරයට අයත් බැංකු ගිණුමේ තිබූ ශේෂය 25,000කි. මෙම වෙනසට හේතුව විය හැක්කේ,

    1) බැංකුව ලද සෘජු ප්‍රේෂණ
    2) නිකුත් කළ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්
    3) තැන්පත් කළ උපලබ්ධි නොවූ චෙක්පත්
    4) බැංකුව එකතු කරගත් ආදායම්

21. බැංකුව විසින් විවිධ සේවා ගාස්තු අය කරනු ලැබේ.(බැංකු ගාස්තු) මෙය ව්‍යාපාරයේ සටහන් විය යුතු වන්නේ,

    1) විවිධ ආදායම් ගිණුමේ හරට
    2) විවිධ ආදායම් ගිණුමේ බැරට
    3) බැංකු ගිණුමේ හරට
    4) බැංකු ගිණුමේ බැරට

22. ව්‍යාපාරයේ බැංකු ගිණුම හා බැංකු ප්‍රකාශනය අයත් ශේෂවල වෙනස්කම් ඇති වීමට හේතු කිහිපයක් දක්වා ඇත.

    A තැන්පත් කළ උපලබ්ධි නොවූ චෙක් රු.10 000

    B බැංකුවට ලැබුණු සෘජු ප්‍රේෂණ රු.10 000

    C නිත්‍ය නියෝග මත බැංකුවේ ගෙවීම් රු.5 000

බැංකු ගිණුම සංශෝධනයට අදාල වන කරුණු වන්නේ,

    1) A පමණි
    2) A හා B පමණි
    3) B හා C පමණි
    4) A,B,C සියල්ලම

23. හසාරාගේ ව්‍යාපාරයේ 2021.07.31 දිනට ව්‍යාපාරයේ ගිණුම අනුව බැංකු ශේෂය 27 500කි. එදිනට ලද බැංකු ප්‍රකාශයේ ශේෂය රු. 25 000කි. මෙම වෙනසට හේතු වූ ගණුදෙනුව වන්නේ,

    1) නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 25 000කි.
    2) බැංකුවට ලද සෘජු ප්‍රේෂණය රු. 2 500කි.
    3) බැංකුව විසින් ස්ථාවර නියෝග මත ගෙවා ඇති වියදම රු. 2 500කි.
    4) බැංකුව ලද ඉතුරුම් පොලිය රු. 2 500කි.

24. බැංකුවෙන් ලද ප්‍රකාශයේ හර පැත්තේ තිබිය හැකි අයිතමය වන්නේ,

    1) බැංකුව එකතු කරගත් ආදායම්
    2) මුදලින් සිදු කළ තැන්පතු
    3) බැංකුව ලද සෘජු ප්‍රේෂණ
    4) බැංකුව අය කළ ගාස්තුව

25. පහත සඳහන් ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

    1) බැංකු ගිණුමේ ශේෂය වාසිදායක නම් එය ව්‍යාපාරයට වත්කමකි ................
    2) නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් තිබීමෙන් මුදල් පොතේ හා බැංකු ප්‍රකාශනයේ ශේෂ අතර වෙනසක් හට ගනී ..................
    3) බැංකුව අය කළ ගාස්තුව ව්‍යාපාරයේ බැංකු ගිණුමේ හර පැත්තේ වාර්තා කරයි .................
    4) සෘජු ප්‍රේෂණයන් යනු ණය ගැතියන් ව්‍යාපාරයට මුදල් ගෙනැවිත් දීමයි ...................



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

26. පහත සඳහන් අවස්ථා සඳහා හිස්තැනට ගැලපෙන වචනය ලියන්න.

1) බැංකු ගිණුමේ ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කිරීම තුළින් ................ ඇති වේ.
2) බැංකු ප්‍රකාශයේ යම් ගණුදෙනුවක් ලැබීමක් ලෙස දැක්වේ නම් එය මුදල් ගිණුමට ........... කළ යුතුය.
3) චෙක්පත් මගින් ගනුදෙනු කිරීමට වඩාත් පහසු වන්නේ ................. ගිණුමක් තිබීමයි.
4) බැංකුව විසින් අය කරනු ලබන ගාස්තුව ව්‍යාපාරිකයාට ................... කි.

27. විද්‍යානී ව්‍යාපාරයේ පහත ගනුදෙනු සිදුව ඇත.

| | රු. |
|---|---|
| 2021.06.01 බැංකුවේ ශේෂය | 10 000 |
| 2021.06.05 මුදල් තැන්පතු | 20 000 |
| 2021.06.10 නිකුත් කළ චෙක් (001) | 6 000 |
| 2021.06.15චෙක්පත් තැන්පතු (045) | 12 000 |
| 2021.06.20 නිකුත් කළ චෙක් (002) | 24 000 |
| 2021.06.25 චෙක්පත් තැන්පතු (099) | 36 000 |
| 2021.06.30 බැංකුව අයකළ ගාස්තුව | 3 000 |

2021 ජූනි මාසය සඳහා බැංකු ප්‍රකාශනය (Bank Statement) පිළියෙල කරන්න.

- පහත තොරතුරු ඇසුරෙන් 28 සහ 29 සඳහා පිළිතුරු සපයන්න.
- මයිලගම ව්‍යාපාරයේ 2021.07.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුම අනුව ශේෂය රු. 12 345 කි. එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂයේ වෙනසට පහත දෑ බලපාන ලදී.
  - තැන්පත් කළ උපලබ්ධි නොවූ චෙක්පත් රු. 51 357
  - නිකුත් කළ ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 60 000
  - බැංකුවට ලැබුනු ණයගැති මුදල් රු. 34 566
  - බැංකුවට අයකළ ගාස්තුව රු. 1 233

28. ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය කොපමණද?

1. රු. 47 658
2. රු. 56 784
3. රු. 46 758
4. රු. 45 678

29. බැංකු ප්‍රකාශනයේ තිබූ ශේෂය කොපමණද?

1. රු. 34 521
2. රු. 54 231
3. රු. 45 321
4. රු. 54 321

30. ඕෂදීගේ ව්‍යාපාරයේ පහත තොරතුරු සපයා ඇත.

- 2021.01.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු.234,000කි. නමුත් එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය රු.432,000කි. මෙම වෙනස සඳහා පහත හේතු සොයා ගෙන ඇත.

i. ණයගැතියන් බැංකුවේ තැන්පත් කර ඇති සෘජු ප්‍රේෂණ රු. 26,000 කි.
ii. බැංකුව විසින් ගෙවා ඇති විවිධ වියදම් රු.14,000කි.
iii. බැංකුවට ලද ඉතුරුම් පොලිය රු.15,000
iv. නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් රු.450,000කි.
v. තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු. 279,000කි.

අවශ්‍ය වන්නේ,

1.ව්‍යාපාරයේ බැංකු ගිණුම සංශෝධනය කිරීම

2.බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම

31. රංජිත්ගේ ව්‍යාපාරයේ පහත ගණුදෙනු ඔබට දී ඇත.

බැංකු ප්‍රකාශනය

| දිනය | චෙක්පත් අංකය | විස්තරය | හර (-) | බැර (+) | ශේෂය |
|---|---|---|---|---|---|
| 3/1 | - | ශේෂය ඉ/ගෙ | | 28 000 | 28 000 |
| 3/6 | 111 | චෙක් තැන්පතු | | 42 000 | 70 000 |
| 3/12 | 050 | ගෙවූ චෙක්පත් | 15 000 | | 55 000 |
| 3/18 | 222 | චෙක් තැන්පතු | | 54 000 | 109 000 |
| 3/22 | 051 | ගෙවූ චෙක්පත් | 36 000 | | 73 000 |
| 3/24 | - | ණයගැති මුදල් | | 25 000 | 98 000 |
| 3/25 | - | රක්‍ෂණ වාරිකය | 7 000 | | 91 000 |
| 3/30 | - | ලාභාංශ ආදායම් | | 5 000 | 96 000 |
| 3/31 | - | බැංකු ගාස්තුව | 6 000 | | 90 000 |

අමතර තොරතුරු

I. ව්‍යාපාරයක් විසින් නිකුත් කළ (052) චෙක්පත රු.30 000 හා තැන්පත් කළ (333) චෙක්පත් රු.50 000 පිළිවෙලින් බැංකු ප්‍රකාශයේ නොදැක්වේ.

II. 2021.03.31 දිනට ව්‍යාපාරයේ තිබූ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනයට පෙර රු.93 000කි.

III. බැංකු ප්‍රකාශනයක් ලැබුනු පසුව මාර්තු 24 දින සිට ගනුදෙනු ව්‍යාපාරයේ බැංකු ගිණුමේ වාර්තා කරයි.

1. ව්‍යාපාරයේ බැංකු ගිණුම සංශෝධනය කරන්න.
2. බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කරන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව